ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

# පුවත්පත් නිවේදනය

## <u>දකුණු පළාතේ සුහුරු පන්ති කාමර 200ක් ඉදි කිරීම: දකුණු පළාතේ පාසල් රැසක් සඳහා ඩිජිටල් උපකරණ භාර දේ</u>

ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමා සහ ශ්‍රී ලංකාවේ ඉන්දීය මහ කොමසාරිස් සන්තෝෂ් ජා මහතා 2024 ජූලි 6 වන දින ගාල්ලේදී පැවති උත්සවයක දී දකුණු පළාතේ පාසල් රැසක් සඳහා ඩිජිටල් උපකරණ ලබා දුන්හ. අධ්‍යාපන අමාත්‍ය ආචාර්ය සුසිල් ප්‍රේමජයන්ත මහතා සහ සෞඛ්‍ය අමාත්‍ය ආචාර්ය රමේෂ් පතිරණ මහතා ඇතුළු සම්භාවනීය අමුත්තන් රැසක් මෙම අවස්ථාව සඳහා සහභාගී වූහ.

2. මෙම ඩිජිටල් උපකරණ ඉන්දීය රජයේ ප්‍රදාන යටතේ දකුණු පළාතේ සුහුරු පන්ති කාමර 200ක් ස්ථාපිත කිරීම සඳහා වන ව්‍යාපෘතියක් යටතේ භාර දෙන ලදී. දකුණු පළාතේ පාසල් 200ක් සඳහා ඩිජිටල් උපකරණ සපයමින් එම පාසල් ලොව පුරා ඩිජිටල් සම්පත් සහ තොරතුරුවලින් ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා බලගැන්වීම මෙම ව්‍යාපෘතියේ අරමුණයි.

3. මෙම අවස්ථාවේ අදහස් දක්වමින් ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා අධ්‍යාපන ක්ෂේත්‍රය සඳහා ලබා දෙන විවිධාකාර සහයෝගය සම්බන්ධයෙන් ඉන්දීය රජයට සහ අග්‍රාමාත්‍ය ශ්‍රී නරේන්ද්‍ර මෝදි මැතිතුමාට සිය ස්තුතිය පළ කළේය.

4. මේ අතර මහ කොමසාරිස් සන්තෝෂ් ජා මහතා අවධාරණය කළේ ඉන්දියාව මෑත වසරවලදී අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ ඉතා ඉහළ තාක්ෂණික දියුණුවක් ලබා ඇති බවයි. එසේම, එම දියුණුවේ ප්‍රතිලාභ ශ්‍රී ලංකාවේ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට සහ ගුරුවරුන්ට ලබා දීමට ඉන්දීය රජය කැපවී සිටින බව එතුමා ප්‍රකාශ කළේය. ඉන්දීය රජය දකුණු පළාත තුළ ජනතා කේන්ද්‍රීය ව්‍යාපෘතීන් රැසක් ක්‍රියාවට නංවා ඇති බව සඳහන් කළ මහ කොමසාරිස්තුමා පළාතේ දිස්ත්‍රික්ක තුන තුළ නිවාස නොමැති ජනතාව සඳහා නිවාස 1300ක් ද ඉදි කෙරෙමින් පවතින බව ප්‍රකාශ කළේය.

5. දකුණු පළාතේ සුහුරු පන්ති කාමර ස්ථාපනය කිරීම ද්විපාර්ශ්වික ඉහළ බලපෑමක් සහිත ප්‍රජා සංවර්ධන ව්‍යාපෘති රාමුව යටතේ සිදු කෙරේ. මෙම ව්‍යාපෘති රාමුව යටතේ විවිධ ක්ෂේත්‍රවල ප්‍රදාන ව්‍යාපෘතීන් 18ක් ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක 18ම ආවරණය කරමින් ක්‍රියාවට නංවා ඇත. මෙම ව්‍යාපෘතිවල වටිනාකම ඇමරිකානු ඩොලර් බිලියන 5.5ක් පමණ වේ.

***

කොළඹ
2024 ජූනි 07